# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2091/58 - 2018 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස: අධිකරණ

## ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම්

### 2018 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් එම ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලැබූ රීති.

1. ඩබ්ලිව්. පී. ජී. ඩෙප්, අග්‍ර විනිශ්චයකාර
2. එස්. ඊ. වනසුන්දර, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර
3. බී. පී. අළුවිහාරේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර
4. කේ. එස්. ජේ. ද ආබෲ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

1. මේ රීති 2018 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ රීති මගින් 1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවල, II වන කොටසට 3(1) (ඇ) සහ 3(1) (ඈ) වශයෙන් රීති ඇතුළත් කරමින් ද IV වන කොටසට 5 (8) රීතියක් ඇතුළත් කරමින් ද සහ VI වන කොටස වශයෙන් කොටසක් ඇතුළත් කරමින් ද සංශෝධනය කරනු ලබන අතර, අග්‍ර විනිශ්චයාකාරවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරන නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට බලාත්මක වන්නේ ය. මේ රීතිවල විවිධ කොටස් සඳහා විධිධ දිනයන් නියම කරනු ලැබිය හැකිය.

**1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවල II වන කොටසට 3 (1) (ඇ) වශයෙන් රීතියක් ඇතුළත් කරමින් කරන සංශෝධනය**

''ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා 138, 140 සහ 141 ව්‍යවස්ථා යටතේ ගොනු කරනු ලබන ඕනෑම මෝසමක දී එක් පෙත්සම්කරුවකු හෝ එක් වගඋත්තරකරුවකුට වඩා වැඩි ගණනක් සිටින අවස්ථාවක පළමුවන පෙත්සම්කරුගෙන් සහ පළමුවන වගඋත්තරකරුගේ නම් පමණක් සඳහන් කෙටි ශීර්ෂයක් තිබීම ප්‍රමාණවත් විය යුතු ය.''



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවල II වන කොටසට 3 (1) (ඈ) වශයෙන් රීතියක් ඇතුළත් කරමින් කරන සංශෝධනය**

අදාළ විය හැකි පරිදි පෙත්සම සහ/හෝ ඉල්ලීම පහත සම්ප්‍රකාශයකින් යුක්ත වන්නේ නම් එය 1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවල 3 (1) (ඇ) සහ 3 (1) (ඈ) යන රීතිවලට ප්‍රමාණවත් අනුකූලවීමක් විය යුතු වේ.

*අ.* පෙත්සමේ ඇතුළත් සම්ප්‍රකාශ සත්‍ය බවට මම ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි/දිවුරා ප්‍රකාශ කරමි හෝ පෙත්සමේ ඇතුළත් සම්ප්‍රකාශ සත්‍ය බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කිරීමට/දිවුරා ප්‍රකාශ කිරීමට මට උපදෙස් ලැබී ඇත.

*ආ.* මාගේ දැනුම ප්‍රකාරව සහ මා වෙත ඇති ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පෙත්සමේ කරුණු සත්‍ය බවට මා දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

**1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවල IV කොටසට 5 (8) වශයෙන් රීතියක් ඇතුළත් කරමින් කරන සංශෝධනය**

(8) මේ රීතියේ කාර්යයන් උදෙසා ''රජයේ නිලධරයා'' යන්නෙන් අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන කවර හෝ නිලයක් දරන්නා වූ තැනැත්තෙක් අදහස් වේ.

එයට-

(i) රාජ්‍ය සංස්ථාවක ඕනෑම ධුරයක් දරන තැනැත්තෙක් ;

(ii) රජයේ අමාත්‍යවරයෙක් හෝ ඕනෑම පළාත් සභාවක අමාත්‍යවරයෙක් ;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවක සාමාජිකයෙක් ;

(iv) පරීක්ෂණ කොමිෂන් සභා පනත හා එහි සංශෝධන ප්‍රකාරව එම විධිවිධානයන් යටතේ පත්කරන ලද කොමිෂන් සභාවක සාමාජිකයෙක් ;

(v) 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත හා එහි සංශෝධන ප්‍රකාරව එම විධිවිධාන යටතේ පත් කරන ලද කොමිෂන් සභාවක සාමාජිකයෙකු සහ/හෝ පරීක්ෂණ කොමිෂන් සභා පනත හා එහි සංශෝධන අනුව හැර වෙනත් ඕනෑම නීතියක් යටතේ පත් කරන ලද ඕනෑම කොමිෂන් සභාවක සාමාජිකයෙක්,

ඇතුළත් වන්නේ ය.

**1990 අභියාචනාධිකරණ (අභියාචන කාර්ය විධානය) රීතිවලට VI වශයෙන් කොටසක් ඇතුළත් කරමින් කරන සංශෝධනය**

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138, 140 සහ 141 ව්‍යවස්ථා යටතේ වූ ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ගොනු කරන ලබන සෑම පෙත්සම්කරුවෙකුම එවැනි සෑම ඉල්ලීමක් සමගම පෙත්සම්කරු මියගිය හොත් සහ/හෝ පෙත්සම්කරුගේ තත්වයේ වෙනස් වීමක් සිදුවුවහොත්, එම මියායාමෙන් සහ/හෝ වෙනසින් පසුව ද එම ඉල්ලීම හෝ අභියාචනය ඉදිරියට පවත්වාගෙන යාම අතිරික්තව පවතීනම්, ඒ සෑම පෙත්සම්කරුවෙකු විසින්ම එම ඉල්ලීම ඉදිරියට පවත්වාගෙන යාමේ කාර්යය සඳහා තමාගේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ප්‍රමුඛත්වය අනුව අවම වශයෙන් එක් තැනැත්තෙක් සහ තිදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් නම් කරමින් මෙම රීතිවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරාණුකූලවූ ලේඛනයක් ගොනු කළ යුතු ය.

(2) සෑම වගඋත්තරකරුවෙකුම පෙනී සිටීමක් සටහන් කිරීමේ දී වගඋත්තරකරු මියගියහොත් සහ/හෝ එම වගඋත්තරකරුගේ තත්වයේ වෙනසක් සිදුවුවහොත් එම වගඋත්තරකරුගේ ඉල්ලීම ඉදිරියට පවත්වාගෙන යාමේ කාර්යය සඳහා තමාගේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ප්‍රමුඛත්වය අනුව අවම වශයෙන් එක් තැනැත්තෙක් සහ තිදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් නම් කරමින් මෙම රීතිවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරාණුකූලවූ ලේඛනයක් ගොනු කළ යුතු ය.

(3) ඉහත පරිදි වූ ලේඛනයක් ගොනු නොකොට පෙත්සම්කරු මියගියහොත් හෝ පෙත්සම්කරුගේ තත්වය වෙනස් වුවහොත් එම ඉල්ලීම නිෂ්ප්‍රභා කළ හැකි වන්නේ ය.

(4) ඉහත පරිදි වූ ලේඛනයක් ගොනු නොකොට වගඋත්තරකරු මියගියහොත් හෝ වගඋත්තරකරුගේ තත්ත්වය වෙනස් වුවහොත් එම වගඋත්තරකරු වෙනුවට නීත්‍යානුකූල නියෝජියෙකු ආදේශ කිරීමකින් තොරව අධිකරණය විසින් එම ඉල්ලීම අසා නිම කළ හැකිය.

(5) සෑම පෙත්සම්කරුවෙකුම සහ/හෝ වගඋත්තරකරුවෙකුම ඕනෑම ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ගොනු කිරීමෙන් මාස තුනක් තුළ පෙත්සම්කරු හෝ වගඋත්තරකරු මියගියහොත් හෝ තත්ත්වය වෙනස් වීමක් සිදුවුවහොත්, පෙත්සම්කරු හෝ වගඋත්තරකරු වෙනුවෙන් නම් කරන නීත්‍යානුකූල නියෝජිත පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගේ ලිඛිත කැමැත්ත ප්‍රකාශ කරන ලේඛනයක් ගොනු කළ යුතු වේ.

(6) එසේ ක්‍රියා නොකරනු ලබන සෑම පෙත්සම්කරුවෙකුටම සහ හෝ වගඋත්තරකරුවෙකුටම ඉහතින් දක්වා ඇති ප්‍රතිවිපාකයනට මුහුණ දීමට සිදු විය හැකි වේ.

(7) නඩු ශීර්ෂයේ වෙනස් කිරීමේ අවශ්‍යතාවය උද්ගත වූ දින සිට මසක් තුළ පෙත්සම්කරු/ඉල්ලුම්කරු විසින් එම ශීර්ෂය සංශෝධනය කළ යුතු ය.

(8) ඉහත පරිදි ක්‍රියා කිරීම පැහැර හැර ඇති පෙත්සම්කරුවෙකුගේ/ඉල්ලුම්කරුවෙකුගේ පෙත්සම/ඉල්ලීම නිශ්ප්‍රභ කළ හැකි වන්නේ ය.

(9) නිල තත්ත්වයෙන් පෙත්සමක්/ඉල්ලීමක් ගොනු කරන හෝ නිල තත්ත්වයෙන් වගඋත්තරකරුවෙකු ලෙස දක්වා ඇති රජයේ නිලධරයකුට මෙම රීතිය අදාළ නොවේ.

ඩබ්ලිව්. පී. ජී. ඩෙප්
අග්‍ර විනිශ්චයකාර

එස්. ඊ. වනසුන්දර
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

බී. පී. අළුවිහාරේ
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

කේ. එස්. ජේ. ද ආබෲ
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

ලේඛනය

**නෛතික නියෝජිතයකු නම් කරන ලේඛනයේ ආකෘති පත්‍රය**

අභියාචනාධිකරණයේ පෙත්සමෙහි/ඉල්ලීමෙහි අංකය ............................

මේ නඩුව අවසාන වශයෙන් අසා තීරණය කිරීමට පෙර මගේ මරණය සිදු වුවහොත් මේ නඩුවේ කාර්ය සඳහා මේ නඩුවේ (පෙත්සම්කරු/ඉල්ලුම්කරු/වගඋත්තරකරු/එක් කිරීමට/ආදේශ කිරීමට ඉල්ලා සිටින පාර්ශවය) වන මම ........................................................................................................................ මේ නඩුවේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නම් කරමි.

ප්‍රමුඛතා අංක 1................................................................................................ හි පදිංචි (ලිපිනය) ...................................................................(නම)

2..............................................................................(නම)...........................................................................................(ලිපිනය)

3..............................................................................(නම)...........................................................................................(ලිපිනය)

ඉහත කී පරිදි මගේ මරණය සිදුවුව හොත් මේ නඩුවේ කාර්ය සඳහා මගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් ඔවුන් දක්වා ඇති ප්‍රමුඛතා අනු පිළිවෙල අනුව ඔවුන් පත්කරන ලෙස මා මෙයින් තවදුරටත් ඉල්ලා සිටිමි.

..........................................................................................................................................හි පදිංචි..................................
..............................................................................................වන මම ඉහත කී පත්කිරීමට කැමැත්ත පළ කරමි.

..................................;
අත්සන

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දුන් බවටත් ඔහු 20................. මස ................. දින දී මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු වන.................................................................හි පදිංචි ..................................................වන මම මෙයින් සහතික කරමි.

..................................;
අත්සන

නීතිඥ/සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

..............................................................................පදිංචි.....................................................වන මම ඉහත කී පත්කිරීමට කැමැත්ත පළ කරමි.

..................................;
අත්සන

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම්කර දුන් බවටත් ඔහු 20........................ මස................. දින දී මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයෙකු/සාමදාන විනිශ්චයකාරකරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු වන ..............................................................හි පදිංචි....................................................................වන මම මෙයින් සහතික කරමි.

..................................;
අත්සන

නීතිඥ/සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

.............................................................................................................................පදිංචි.............................................................
වන මම ඉහත කී පත්කිරීමට කැමැත්ත පළකරමි.

...................................;
අත්සන

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දුන් බවටත් ඔහු 20................................. මස ..................... දින දී මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු වන ..................................................... හි පදිංචි................................................වන මම මෙයින් සහතික කරමි.

...................................;
අත්සන

නීතිඥ/සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

10 - 1078

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.